

# වී ඇටයක කතන්දරේ

ද්වානා රත්නායක

# වී ඇටයක කතන්දරේ

ද්වානා රත්නායක

# වී ඇටයක කතන්දරේ


## ද්වානා රත්නායක



**ISBN 978-624-206-738-4**


කතෘගේ වෙනත් පොත්  - සමනල පැටියා

වැහි බිඳුවක ගමන

**2023-12-18**

# <u>පිදුම</u>

මාගේ ආදරණීය තාත්තාටත්, අම්මාටත්,

හැමවිටම මා දිරිමත් කරනා

මාගේ අත්තම්මාටත්,

මාගේ දඟ මල්ල නංගී අමීටත්, චූටි මල්ලි එවීටත්

ඉතා සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල්වල දරුවන් යොමුකල විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

එකමත් එක ගමක ගොවි මාමෙක් හිටියා .මේ ගොවි මාමා
ගොඩක් කැමති වුණේ කුඹුරේ  වී වගා කරන්න.
ඉස්සර වෙලාම ගොවි මාමා කුඹුර කෙටුවා.
නියරේ වක්කඩ බැඳල වතුර පිරෙව්වා.



ඊට පස්සෙ මාවයි මගේ යාළුවොයි පැළ කරන්න සූදානම් වුණා.
අපිව වතුරේ ගිල්ලවලා රෑ එළිවෙනකම් තිබ්බා.
සීතල වතුරේ ඉන්න අපිට හරිම සතුටුයි.
අපි වතුර බීලා බීලා පිම්බුණා.



පහුවදා උදේ වතුර අයින් කරලා අපිව ගෝනියකට දාලා
කට ගැට ගැසුවා.
ගෝනිය ඇතුළේ අපිට ඉඩ මදි අපි හිරවෙලා හිටියේ.
අපිට හුස්ම ගන්නත් අමාරුයි.




ටික දවසකින් ගොවි මාමා ගෝනිය ඇරලා බලනකොට
අපි ඔක්කොම පැළවෙලා.
හැමෝගෙන්ම සුදු පාට පුංචි මුලක් ඇවිල්ලා.
ගොවි මාමටයි, අපිටයි හරි සතුටුයි.




ගොවි මාමා අපිව කුඹුරට
ගෙනිහින්
තැන් තැන්වලට ඉස්සා.





පහුවදා ඉර පායනකොට අපි ඇහැරලා බැලුවා.
පුංචි ලා කොළපාට කොළයක් ඇවිල්ලා.
අපි කුඹුරේ පැළ වෙලා.
හරිම සතුටුයි.

දවසින් දවස බලනකොට අපි ඉක්මනින් ලොකු වෙලා.
සුළඟ හමන විට අපි හරි සතුටින් වැනුණා.
ගොවි මාමා අපට වතුර, පොහොර
සහ හැමදේම ලබා දුන්නා.
අපි ගොඩක් සතුටින් ලොකු වුණා.




අපේ කඳ ටිකෙන් ටික මහත් වුණා.
අපිව බලන්න ගොවි මාමා හැමදාම උදේට කුඹුරට එනවා.
“දැන් නම් පීදෙන්න ලඟයි”
ගොවි මාමා කියනවා අපිට ඇහුණා.



අපේ කඳුවල් වලින් පුංචි කරලක් ආවා.
වී ඇට ගොඩයි. කොළ පාටයි.
හිරු එළියට අපේ කරල් රන්වන් පාට වුණා.
කරල් බිමට නැමුණා.
මට වඩා ලස්සන මගේ කරල්.
මමත් ටික ටික රන්වන් පාට වූණා.



එක දවසක් ගිරා රංචුවකුයි, වී කුරුළු රංචුවකුයි කුඹුරට ආවා.
අපේ කරල්වල වී ඇට කෑවා.
අපිට ගොඩක් රිදුණා.
ගොවි මාමා කුරුල්ලන්ව එලෙව්වා.




ගිරා රංචුවයි, වී කුරුළු රංචුවයි කුඹුරට එන්න පුරුදු වුණා.
ගොවි මාමා මහන්සිවෙලා එලෙව්වත් ගියේ නෑ.
ගොවි මාමා මේකට හොඳ උපායක් යෙදුවා.
“පඹයෙක් හදලා කුඹුර මැද්දෙ හිටවන්න ඕනෑ”
ගොවි මාමා හිතුවා.
දවසක් ගොවි මාමා කුඹුරේ පඹයෙක් හිටෙව්වා.





කුරුල්ලෝ වී කන්න ආවා.
එයාලා කුඹුර මැද්දේ ලොකු මහත්තයෙක්
ඉන්නවා දැක්කා.
ලොකු තොප්පියකුයි, කළු කෝට් එකකුයි
ඇඳගෙන ඉන්නවා දැක්ක කුරුල්ලෝ හොඳටම බය වුණා.
ඈතට පියඹලා ගියා.
ආපසු වී කන්න කුඹුරට ආවේ නැහැ.





“ගොවි මාමගෙ උපාය නිසා අපි බේරුණා”
ගොයම් කරල් සතුටින් කෑ ගැසුවා.
අපිව බේරලා දුන්නට, සුළඟ සිලි සිලි ගා වැනිලා
ගොවි මාමට අපි “ස්තුතියි” කිවුවා.

... නිමි ...

# <u>පසුවදන</u>



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්ව පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මාවිසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනාකරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘතිය රචනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

**සෙනෙවිරත්න මහලේකම්**

**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**

**2023.11.01**